# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,499/5 – 2007 මැයි 28 වැනි සඳුදා – 2007.05.28

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

1998.10.29 දිනැති අංක 1051/12 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලදුව 2000.11.06 දිනැති අංක 1157/04 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් සංශෝධනය කළ ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාවට කරන ලද පහත සඳහන් සංශෝධන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලදුව දැන ගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලැබේ.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2007 මැයි මස 23 වෙනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාව

01. නම : මෙම ව්‍යවස්ථා සංග්‍රහය ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ලෙස හඳුන්වනු ලැබේ.

02. *නිර්වචනය* :

2 : 1 "සේවය "ලෙස දැක්වෙන අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා තක්සේරු සේවය අදහස් විය යුතුය.

2 : 2 " ව්‍යවස්ථාව " ලෙස දැක්වෙන අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථාව අදහස් විය යුතුය.

2 : 3 "දේපල පාලනය හා තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධිය" ලෙස දැක්වෙන අවස්ථාවන්හිදී දේපල පාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ ) උපාධිය අදහස් වේ.

03. බලපැවැත්වීම :

3 : 1 තක්සේරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා පුහුණුව උපයෝගී කරගෙන සේවයෙහි නියැලෙන 1 වන උපලේඛනයෙහි සඳහන් තනතුරු වල සියලුම නිලධාරීන් මෙම සේවයට ඇතුලත් වනු ඇත.

3 : 2 මෙම ව්‍යවස්ථා සංග්‍රහය, 1998.01.01 දින සිට ශ්‍රී ලංකා තක්සේරු සේවයට අන්තර්ග්‍රහණය කරන ලද හා ඊට පසු බඳවාගනු ලැබූ හෝ ඉදිරියේ දී බඳවාගනු ලබන නිලධාරීන් විෂයයෙහි බලපැවැත්විය යුතුය. ශ්‍රී ලංකා තක්සේරු සේවය ශ්‍රේණිගතකර ඇති ආකාරය1 වන උපලේඛනයේ දක්වා ඇති ආකාරයට විය යුතුය.

3 : 3 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ රජය විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා / හෝ රෙගුලාසි වලට මෙම නිලධාරීන් යටත්වනු ඇත.

04. ක්‍රියාත්මක වන දිනය :

අංක 1051/12 හා 1998 ඔක්තෝබර් 29 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ වූ සහ අංක 1157/4 හා 2000 නොවැම්බර් 6 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් සංශෝධනය වී 1998.01.01 දින සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා තක්සේරු සේවය මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් සංශෝධනය සහිතව 2007.06.01 දින සිට බලපැවැත්විය යුතු ය.

05. පාලනය :

5 : 1 මෙම සේවා ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා යම් විශ්ව විද්‍යාලයක උපාධියක් පිලිගතයුතු වන්නේද, නැතහොත් පිළිගත යුතු නොවන්නේ ද යන ප්‍රශ්නය පැන නැගුණු අවස්ථාවකදී ඒ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ බලධාරියා වන්නේ ප්‍රධාන තක්සේරුකරු විමසා ක්‍රියා කරන විශ්ව විද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවය.

5 : 2 මෙම සේවයේ නිලධාරීන් මාරුවීම්වලට යටත්වන අතර, ඔවුන්හට දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට නියම කරනු ලැබිය හැකි ය.

5 : 3 විභාග දෙපාර්තමේන්තුව විසින් වෙනත් සේවයන්ට අදාලවද පවත්වනු ලබන විභාගයක්, නොවන, මෙම සේවා ව්‍යවස්ථාවේ සඳහන් අනෙකුත් සියලුම විභාගයන්, පත්කිරීමේ බලධරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන අයෙකු විසින් හෝ පවත්වනු ලැබිය යුතුය.

5 : 4 1 පංතිය 1 ශ්‍රේණියට සහ ඊට පහල සියලුම නිලධාරීන් පත් කිරීමේ දී සහ උසස් කිරීමේදී සහාය වනු පිණිස රාජ්‍ය නිලධාරීගෙන් සමන්විත තෝරා ගැනීමේ මණ්ඩල/ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නම් කිරීම, පත්කිරීමේ බලධරියා විසින් කළ යුතුය.

5 : 5 ඉහත 5.1 වගන්තියේ දක්වා ඇති විධිවිධානය හැර අනෙකුත් විධිවිධාන අර්ථ නිරූපනය කිරීමේහිලා උද්ගත වන අපැහැදිලි අවස්ථාවන්හිදී ප්‍රධාන තක්සේරුකරු හා මුදල් අමාත්‍යාංශයේ ලේකම් විමසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසානාත්මක විය යුතුය.

06. ව්‍යුහය හා සේවක සංඛ්‍යාව :

ශ්‍රී ලංකා තක්සේරු සේවයේ ව්‍යුහය හා සේවක සංඛ්‍යාව 01 වන උපලේඛනයේ දැක්වෙන අතර ශ්‍රේණිගත අනුපාතයන් පහත පරිදි වේ.

| *පංතිය හා ශ්‍රේණිය* | *ඉහල ශ්‍රේණියට අනුව අනුපාතය* |
|---|---|
| I පංතිය II ශ්‍රේණිය | 1 : 3 |
| II පංතිය I ශ්‍රේණිය | 1 : 4 |
| II පංතිය II ශ්‍රේණිය | 1 : 5 |
| III පංතිය II ශ්‍රේණිය | 1 : 5 |

07. කාර්යක්ෂමතා කඩඉම් හා සේවා විභාගයන් :

07.1 මෙම සේවයේ පංති /ශ්‍රේණීන් සඳහා පහත දැක්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග අදාල වේ.

| *පංතිය හා ශ්‍රේණිය* | *කාර්යක්ෂමතා කඩඉම් විභාගය* | *වැටුප් පියවර* |
|---|---|---|
| II පංතිය II ශ්‍රේණිය | 1 වන කා. ක. විභාගය | රු. 24,225 ට පෙර |
| | 2 වන කා. ක. විභාගය | රු. 26,805ට පෙර |
| III පංතිය II ශ්‍රේණිය | 1 වන කා. ක. විභාගය | රු. 16,365 ට පෙර |
| III පංතිය II ශ්‍රේණිය | 2 වන කා. කා විභාගය | රු. 17,525ට පෙර |

07.1.1 මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට අදාල විස්තර 02 වන උපලේඛනයේ දැක්වේ.

07. 2 මෙම සේවයේ ඒ ඒ පංති හා ශ්‍රේණි සඳහා පහත සඳහන් වන සේවා විභාග අදාළ වේ.

07.2.1 III පංතිය II ශ්‍රේණිය 1 වන සේවා විභාගය
II පංතිය II ශ්‍රේණිය 2 වන සේවා විභාගය

07.2.2 මෙම සේවා විභාගවලට අදාල විස්තර 3 වන උපලේඛනයේ දැක්වේ.

08. බඳවා ගැනීමේ පරිපාටිය :

08.1. පත්කිරීමේ බලධාරියා

08.1.1. ප්‍රධාන තක්සේරුකරු පත්කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් සිදුකළ යුතුය.

08.1.2 අනෙකුත් සියලුම පංති/ශ්‍රේණීන්ට පත්කිරීම් සහ උසස් කිරීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද පරිදි සිදු කළ යුතුය.

08.2. පත්කිරීමේ ක්‍රියා පටිපාටිය හා සුදුසුකම් :—

08.2.1 ප්‍රධාන තක්සේරුකරු තනතුර අතිරේක ප්‍රධාන තක්සේරුකරු උසස් කිරීමෙන් පිරවිය යුතුය.

ප්‍රධාන තක්සේරුකරු තනතුරට පත්කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපනික /වෘත්තීයමය සුදුසුකම් පහත සඳහන් පරිදි ය.

8.2.1(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක දේපළ පාලනය හා තක්සේරුකරණය පිළිබඳ උපාධිය සමත් වීම.

සහ

8.2.1(ආ) එක්සත් රාජධානියේ වරලත් මිනුම්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ (පොදු අංශයේ) සාමාජිකත්වය සහිත වරලත් තක්සේරුකරුවකු වීම.

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක දේපළ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් සමත් වීම.

8.2.1 (ඇ) මෙම සංශෝධිත ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට වයස අවුරුදු 55 ඉක්මවා ඇති ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පංතියේ නිලධාරීන් ඉහත 8.2.1 (ආ) අවශ්‍යතාවයෙන් නිදහස් විය යුතුය.

මෙම සංශෝධිත ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට වයස අවුරුදු 50 ඉක්මවා ඇති ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පංතියේ නිලධාරීන් සහ 2010.12.31 දින දක්වා අන්තර් කාලය තුළදී වයස අවුරුදු 50 ඉක්මවන ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පන්තිය II ශ්‍රේණියේ නිලධාරීන් ඉහත 8.2.1 (ආ) අවශ්‍යතාවය වෙනුවට තක්සේරු ක්ෂේත්‍රයට අදාල ලිඛිත ප්‍රතිපත්ති පත්‍රිකාවක් දේපළ පාලනය හා තක්සේරුකරණය පිළිබඳ උපාධි පාඨමාලාව පවත්වන විශ්ව විද්‍යාලයේ අංශ ප්‍රධාන වෙත ඉදිරිපත් කර සමත් විය යුතුය. මෙම ඉදිරිපත් කිරීම සඳහා තීරක මණ්ඩලයක් අංශ ප්‍රධාන විසින් පත්කළ යුතුය. මෙම ප්‍රතිපත්ති පත්‍රිකාවේ විෂය සීමාව ප්‍රධාන තක්සේරුකරු විමසා දේපළ පාලනය හා තක්සේරු විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධානියා විසින් තීරණය කළ යුතුය.

08.3 I වන පංතිය :

08.3.1 I වන පංතියේ I වන ශ්‍රේණිය – අතිරේක ප්‍රධාන තක්සේරුකරු තනතුරට පත් කිරීම.

i. ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I වන පංතියේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසරක සේවා කාලයක් හා පහත සඳහන් අධ්‍යාපනික හා/හෝ වෘත්තීයමය සුදුසුකම් ඇති නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරුවන් අතිරින් ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතාවය මත උසස් කිරීමෙන් අතිරේක ප්‍රධාන තක්සේරුකරු තනතුරට පත් කළ යුතුය.

ii. අතිරේක ප්‍රධාන තක්සේරුකරු තනතුරට පත් කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපනික /වෘත්තීයමය සුදුසුකම් පහත දැක්වෙන පරිදිය.

8.3.1 (අ) පිළිගත් විශ්වවිද්‍යාලයක දේපළ පාලනය හා තක්සේරුකරණය පිළිබඳ උපාධිය සමත් වීම

සහ

8.3.1 (ආ) එක්සත් රාජධානියේ වරලත් මිනුම්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ (පොදු අංශයේ) සාමාජිකත්වය සහිත වරලත් තක්සේරුකරුවකු වීම.

හෝ

පිලිගත් විශ්ව විද්‍යාලයක දේපළ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් සමත් වීම.

8.3.1 (ඇ) මෙම සංශෝධිත ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට වයස අවුරුදු 55 ඉක්මවා ඇති ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පංතියේ නිලධාරීන් ඉහත 8.3.1 (ආ) අවශ්‍යතාවයෙන් නිදහස් විය යුතුය.

මෙම සංශෝධිත ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට වයස අවුරුදු 50 ඉක්මවා ඇති ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පංතියේ නිලධාරීන් සහ 2010.12.31 දින දක්වා අන්තර් කාලය තුළදී වයස අවුරුදු 50 ඉක්මවන ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පන්තිය II ශ්‍රේණියේ නිලධාරීන් ඉහත 8.31 (ආ) අවශ්‍යතාවය වෙනුවට තක්සේරු ක්ෂේත්‍රයට අදාල ලිඛිත ප්‍රතිපත්ති පත්‍රිකාවක් දේපළ පාලනය හා තක්සේරුකරණය පිළිබඳ උපාධි පාඨමාලාව පවත්වන විශ්ව විද්‍යාලයේ අංශ ප්‍රධාන වෙත ඉදිරිපත් කර සමත් විය යුතුය. මෙම ඉදිරිපත් කිරීම සඳහා තීරක මණ්ඩලයක් අංශ ප්‍රධාන විසින් පත්කළ යුතුය. මෙම ප්‍රතිපත්ති පත්‍රිකාවේ විෂය සීමාව ප්‍රධාන තක්සේරුකරු විමසා දේපළ පාලනය හා තක්සේරු විද්‍යා අධ්‍යයන අංශ ප්‍රධානියා විසින් තීරණය කළ යුතුය.

මෙම සේවා ව්‍යවස්ථාවේ 05.4 වගන්තිය යටතේ පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් සිදු කෙරෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කළ යුතු ය.

8.3.2 *I වන පංතියේ II වන ශ්‍රේණිය – නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු තනතුරට පත් කිරීම*

ශ්‍රී ලංකා තක්සේරු සේවයේ II පංතියේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් සහිත නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාවය මත උසස් කිරීමෙන් නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු තනතුරට පත්කළ යුතුය.

මෙම සේවා ව්‍යවස්ථාවේ 05.4 වගන්තිය යටතේ පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් සිදු කෙරෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදුකළ යුතුය.

8.4 II පංතිය

8.4.1 *II පංතියේ I ශ්‍රේණිය : පළාත් තක්සේරුකරු තනතුරට පත් කිරීම*

8.4.1 (අ) II පංතියේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්දක් සහිතව එම ශ්‍රේණියට අදාල කර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් හෝ විභාගවලින් අවස්ථාවෝචිත පරිදි සමත් වූ හෝ නිදහස් කරනු ලැබූ සහ තම තනතුරෙහි ස්ථිර කරනු ලැබූ නිලධාරීන්ගේ II පංතිය I ශ්‍රේණියට ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත උසස් කිරීමෙන් පිරවිය යුතු ය.

8.4.1 (ආ) ඉහත 8.4.1 (අ) වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අමතරව 3 වන උපලේඛනයේ දැක්වෙන දෙවන සේවා විභාගයෙන් ද සමත්වී තිබිය යුතු ය. සංශෝධිත ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට II පංතියේ II ශ්‍රේණියට අදාල සේවා විභාගය සමත් හෝ නිදහස් කර ඇති නිලධාරීන් මෙම අවශ්‍යතාවයෙන් නිදහස් විය යුතුය.

මෙම සේවා ව්‍යවස්ථාවේ 05.4 වගන්තිය යටතේ පත් කරනු ලැබූ තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් සිදුකෙරෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදුකළ යුතුය.

8.4.2 *II පංතියේ II ශ්‍රේණිය : දිස්ත්‍රික් තක්සේරුකරු තනතුරට පත් කිරීම.*

8.4.2 1 II පංතියේ II ශ්‍රේණියේ සම්පූර්ණ සේවක සංඛ්‍යාවෙන් 40% තනතුරු ප්‍රමාණයක් විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල මත පිරවිය යුතුය.

*සුදුසුකම්.–* යම් තැනැත්තෙකු ඉහත සඳහන් විවෘත තරඟ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීම සඳහා ඔහු/ඇය,

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුවීම සහ,

(ආ) විශිෂ්ඨ චරිතයකින් හෙබි, මනා ඇස් පෙනීමෙන් යුත් සහ මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත තැනැත්තෙකු වීම

සහ

(ඇ) වයස අවු 20ට වැඩිවිය යුතු අතර, වයස අවුරුදු 35ට වැඩි නොවීම

සහ

(ඇ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුය.

(I) පිළිගත් විශ්ව විද්‍යාලයක දේපල පාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියේ පළමු හෝ දෙවන පෙළ ගෞරව සාමාර්ථයක් හෝ

(II) එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ (පොදු අංශය) අවසාන විභාගය සමත් වී තිබීම.

විභාගයෙන් සාමාර්ථය ලබන අපේක්ෂකයින් පත්වීම් ලබාදීමට පෙර මෙම සේවා ව්‍යවස්ථාවේ, 05.4 වගන්තිය යටතේ කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ යුතුය.

8.4..2.2 II පංතියේ II ශ්‍රේණියේ සම්පූර්ණ සේවක සංඛ්‍යාවෙන් 60% ක තනතුරු ප්‍රමාණයක් පහත සඳහන් සුදුසුකම් සහ පළපුරුද්ද සහිත III පංතියේ I ශ්‍රේණියේ නිලධාරීන් උසස් කිරීමෙන් පිරවිය යුතුය. යම් අවස්ථාවක ඉහත පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් නොමැති හෝ ප්‍රමාණවත් නිලධාරීන් III පංතියේ I ශ්‍රේණියේ නොසිටින අවස්ථාවන්හිදී, III පංතියේ II වන ශ්‍රේණියේ සිටින III පංතියේ I ශ්‍රේණිය සඳහා උසස් කිරීමට සුදුසුකම් ලබා ඇති සහ II පංතියේ II ශ්‍රේණිය පත් කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් පිරවීමට පත්වීම් බලධාරියාට අවසර දීමට හැකිවනු ඇත.

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක දේපල කළමණාකරණය පිළිබඳ පිළිබඳ විද්‍යාවේදී උපාධිය.

හෝ

(ආ) එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ (පොදු අංශය)අවසාන විභාගය සමත්වීම.

හෝ

(ඇ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ තක්සේරුකරණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ තක්සේරුකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව හෝ තක්සේරුකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සහිතව තක්සේරු දෙපාර්තමේන්තුවේ අවම වශයෙන් දස වසරක පළපුරුද්ද මින් වසර 03ක් සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද විය යුතුය.

8.4.2.3 **උසස් කිරීමේ ක්‍රමය**

(i) II පන්තිය II ශ්‍රේණියේ මුළු සේවක සංඛ්‍යාවෙන් 20% ක් ඉහත 8.4.2.2. හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති III පංතියේ වසර 10ක් සේවා පළපුරුද්දක් ඇති නිලධාරීන්ගෙන් අදළ සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මත උසස් කිරීමෙන් පත්කළ යුතුය. අදාල සීමිත තරඟ විභාගය සඳහා වන විෂය නිර්දේශය මෙම ව්‍යවස්ථාවේ 04 වන උපලේඛනයේ ඇ කොටසේ පරිදි වේ.

(ii) II පන්තිය II ශ්‍රේණියේ මුළු සේවක සංඛ්‍යාවෙන් 40% ක් ඉහත 8.4.2.2. හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති III පංතියේ I ශ්‍රේණියේ නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත උසස් කිරීමෙන් පත් කළ යුතුය.

(iii) 8.4.2.3 (ii) යටතේ සිදු කෙරෙන තෝරා ගැනීම් මෙම සේවා ව්‍යවස්ථාවේ, 05.4 වගන්තිය යටතේ පත්කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් කළ යුතුය.

8. 4. 3 **II පන්තිය II ශ්‍රේණියට පත් කිරීම පිළිබඳ පොදු කොන්දේසි**

(i) ආයතන සංග්‍රහයේ දක්වා ඇති අදාළ විධි විධානයන්ට යටත්ව දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාවන් බලපානු නොලැබේ.

(ii) තෝරා ගැනීමේ ක්‍රියා පරිපාටිය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අදාළ වේ. විවෘත තරඟ විභාගයේ විෂයය නිර්දේශය මෙම ව්‍යවස්ථාවේ 4 වන උපලේඛනයේ (ආ) වගන්තිය යටතේ දැක්වේ.

(iii) පත්කිරීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් වෛද්‍ය පරීකෂණයකට පෙනී සිටිය යුතුය.

(iv) 8.4.2.1 (1) හා 8.4.2.3 (1) යටතේ තෝරාගනු ලැබූ අයදුම්කරුවන් අතරේ ජ්‍යෙෂ්ඨතාවය නිශ්චය කිරීම අවස්ථාවෝචිත පරිදි විවෘත/සීමිත තරඟ විභාගයේ දී ඔවුන් විසින් ලබාගත් ලකුණු පදනම් කරගෙන කරනු ලබන අතර, 8.4.2.3 (ii) යටතේ උසස් කිරීමට තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ගේ ජ්‍යෙෂ්ඨතාවය,සම්මුඛ පරීක්ෂණයේදී ඔවුන් විසින් ලබාගත් ලකුණු මත නිශ්චය කළ යුතුය.

(v) විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල මත මෙම සේවාවට පත් කරනු ලබන නිලධාරියෙකු වසර 03ක පරිවාස කාලයකට යටත්වේ. පරිවාස කාලය අවසානයේ දී නිලධාරියෙකු II පංතියේ II ශ්‍රේණියට අදාල 02 වන උපලේඛණයෙහි

(ඇ) හි සඳහන් පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් වුවහොත් හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ දක්වා ඇති පරිදි නියමිත රාජ්‍ය භාෂාව/(න්) පිළිබඳ යෝග්‍යතා පරීක්ෂණයෙන් හෝ පරීක්ෂණයන්ගෙන් සමත් වුවහොත් සහ ආයතන සංග්‍රහයේ දක්වා ඇති අවශ්‍යතාවන් සපුරාලීමෙන් පසු සිය තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

(vi) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ දී අදාළ වන ආයතන සංග්‍රහයේ සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති වෙනත් පොදු කොන්දේසීන් ද අදාළ විය යුතුය.

8. 5 **III පන්තිය**

8.5.1 (iii) පංතියේ I ශ්‍රේණිය – සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු I තනතුරුට පත් කිරීම.

8.5.1 (අ) iii පංතියේ ii ශ්‍රේණිය සඳහා වූ i වන සේවා විභාගය සමත්වූ හෝ නිදහස් කරනු ලැබූ සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයන්ගෙන් සමත් වූ iii පංතියේ ii ශ්‍රේණියේ අවම වශයෙන් 10 වසරක සේවා පළපුරුද්දක් සහිත නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත උසස් කිරීමෙන් iii පංතියේ i ශ්‍රේණියට පත්කල යුතුය.

මෙම සේවා ව්‍යවස්ථාවේ 05.4 වගන්තිය යටතේ පත් කරනු ලැබූ තෝරා ගැනීමේ මණ්ඩලයක් මගින් සිදු කෙරෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කළ යුතු ය.

8.5.1 (ආ) එතකුදු වුවත් ඉහත සුදුසුකම් සම්පූර්ණ කළ සහ පසුගිය වසර 5 ක කාලය තුලදී දෙපාර්තමේන්තු නියෝග 264 පරිදි විශිෂ්ඨ ගණයේ කාර්යසාධන මට්ටමක් නොකඩවා පවත්වාගෙන ගිය නිලධාරීන් 6 වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු තරඟ විභාගයක ප්‍රතිඵල මත උපරිමය 10කට යටත්ව උසස් කිරීමෙන් iii පංතියේ i ශ්‍රේණියට පත්කළ හැක.

අදාල තරඟ විභාගය සඳහා වන විෂය නිර්දේශය මෙම ව්‍යවස්ථාවේ 04 වන උපලේඛණයේ ඈ කොටසේ පරිදි වේ.

8.5.2 ***III පංතියේ II ශ්‍රේණිය – සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු II තනතුරට පත් කිරීම***

විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල මත iii පංතියේ ii ශ්‍රේණියට පත් කිරීම කරනු ලැබිය යුතුය.

යෝග්‍යතාවය .–

i. යම් තැනැත්තෙකු විවෘත තරඟ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබනුයේ ඔහු/ඇය

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකුවීම, සහ ;

(ආ) විශිෂ්ඨ චරිතයකින් හෙබි මනා ඇස් පෙනීමෙන් යුත් සහ මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත තැනැත්තෙකු වීම, සහ

(ඇ) වයස අවුරුදු 18ට වැඩිවිය යුතු අතර වයස අවුරුදු 35 ට වැඩි නොවීම, සහ ;

(ඈ) පිළිගත් විශ්ව විද්‍යාලයක දේපල පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

8.5.3 ***III පංතියේ II ශ්‍රේණිය පත් කිරීමට අදාළ පොදු විධිවිධාන***

(i) ආයතන සංග්‍රහයේ දක්වා ඇති අදාල විධිවිධානයන්ට යටත්ව දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ii) තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් හි විධිවිධාන අදාල වේ. විවෘත තරඟ විභාගයේ විෂය නිර්දේශය මෙම සේවා ව්‍යවස්ථාවේ 04 වන උපලේඛනයේ (අ) යටතේ දැක්වෙන පරිදි වේ.

(iii) විවෘත තරඟ විභාගයේදී සාමාර්ථය ලබන අයදුම්කරුවන් පත්වීම ලැබීමට පෙර මෙම සේවා ව්‍යවස්ථාවේ 05.4 වගන්තිය යටතේ පත් කරනු ලැබූ තෝරා ගැනීමේ මණ්ඩලයක් මගින් සිදු කෙරෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කළ යුතුය.

(iv) තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් අතරේ ජ්‍යෙෂ්ඨතාවය විවෘත තරඟ විභාගයේ දී ලබාගත් ලකුණු පදනම් කර තීරණය කරනු ලැබිය යුතුය.

(v) තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් පත්වීම්ලාභියා වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුවේ.

(vi) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ දී, අදාළ වන ආයතන සංග්‍රහයේ සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති වෙනත් පොදු කොන්දේසීන් ද අදාල විය යුතුය.

(vii) විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත මෙම සේවයට පත් කරනු ලබන නිලධාරියෙකු වසර 03ක පරිවාස කාලයකට යටත්වේ. මෙම කාලය අවසානයේදී නිලධාරියෙකු iii පංතියේ ii ශ්‍රේණියට අදාල 02 වන උපලේඛනයේ (අ) හි දක්වා ඇති පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තීන් හි දක්වා ඇති රාජ්‍ය භාෂා පිළිබඳ ප්‍රවීණතා විභාග/ විභාගය සමත්වීම සහ ආයතන සංග්‍රහයේ දක්වා ඇති අදාල අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ පසු සිය තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

නිලධාරියෙකු ව්‍යවස්ථාවේ 07.1 වගන්තියෙහි දැක්වෙන වැටුප්තල ඉක්මවීමට පෙර iii පංතියේ ii ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අදාල වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ද සමත්විය යුතුය.

09. අන්තර්ග්‍රහණය කිරීම .–

9.1 2007.06.01 දිනට ආසන්නතම පෙර දිනදී පැවති ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පංතියේ II ශ්‍රේණිය හා III පංතියේ III ශ්‍රේණිය ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පංතියේ II ශ්‍රේණියේ ලෙස 2007.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකාබද්ධ කරනු ලැබේ.

## 01 වන උපලේඛනය

ශ්‍රී ලංකා තක්සේරු සේවයට අයත් තනතුරු පංති හා ශ්‍රේණි, සේවක සංඛ්‍යාව හා ඒවාට අයත් වැටුප් පරිමාණ

(අ) ප්‍රධාන තක්සේරුකරු – වැටුප් පරිමාණය – රු. 42,390 – 12 x 1,310 – රු. 58,110/-

| *නිල නාමය* | *පංතිය හා ශ්‍රේණිය* | *සේවක* | *වැටුප් පරිමාණය* |
|---|---|---|---|
| අතිරේක ප්‍රධාන තක්සේරුකරු | I පංතියේ I ශ්‍රේණිය | 01 | රු. 37,805–15 x 1,050 රු. 53,555/- |
| නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු | I පංතියේ II ශ්‍රේණිය | 03 | රු. 36,755–16 x 1,050 රු. 53,555/- |
| පළාත් තක්සේරුකරු | II පංතියේ I ශ්‍රේණිය | 12 | රු. 30,175–12 x 790 රු. 39,655/- |
| දිස්ත්‍රික් තක්සේරුකරු | II පංතියේ II ශ්‍රේණිය | 60 | රු. 22,935–16 x 645 රු. 33,255/- |
| සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු I | III පංතියේ I ශ්‍රේණිය | 60 | රු. 19,010–14 x 325+ 11x 400 රු. 27,960/- |
| සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු II | III පංතියේ II ශ්‍රේණිය | 300 | රු. 15,785–18 x 290 - රු. 21,005/- |

## 02 වන උපලේඛනය

*කාර්යක්ෂමතා කඩඉම් විභාග*

(අ) III පංතියේ II ශ්‍රේණිය සඳහා I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (වැටුප් පියවර රු. 16,365/ට පෙර)

පහත සඳහන් පරිදි මෙම විභාගය කොටස් දෙකකින් යුත් ප්‍රායෝගික පරීක්ෂණ වලින් සමන්විත වේ.

I කොටස :

දෙන ලද දේපලක් සම්බන්ධයෙන් නිශ්චිත කාලයක් තුළ දී තත්ත්ව වාර්තාවක් පිළියෙල කිරීම.

*කාලය :* අවමය පැයක් සහ උපරිමය පැය තුනක් අතර නිශ්චිත කාලයක් තීරණය කෙරෙනු ඇත.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40%කි.

*II කොටස :*

*වරිපනම් තක්සේරු .–* දේපල ඒකක හඳුනාගැනීමේ ක්‍රියා පිලිවෙල, දේපළ මැනීම, සැළසුම් ඇඳීම සහ අංක යෙදීම යනාදිය.

*කාලය .–* අවමය පැය 4 ක් සහ උපරිමය පැය 6ක් අතර කාලයකි.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40%කි.

(ආ) iii පංතිය ii ශ්‍රේණිය සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (වැටුප් පියවර රු. 17,525/-ට පෙර)

මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස පැය 1 සිට 2 දක්වා කාලයකින් යුත් ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වන අතර, 11 කොටස වරිපනම් තක්සේරු සඳහා ක්ෂේත්‍ර කටයුතු සහ ඊට අදාල ලේඛන පිලියෙල කිරීම පිළිබඳ පරීක්ෂණයකින් සමන්විත වේ.

මෙම විභාගය සඳහා අදාල වන විෂයය පථයන් පහත දැක්වෙන පරිදි වේ.

*I කොටස :*

(i) පරිපාලනය සහ මූල්‍ය – ආයතන සංග්‍රහයේ II, III, IV, XI, XII, XIV, XIX, XXV, XXVI, XXVIII, පරිච්ඡේද සහ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු. රෙ. 2, 124, 125, 126, 127,128, 135, 136, 137, 138 සහ 139.

(ii) දෙපාර්තමේන්තු සංයුතිය හා පරිපාලනය

(iii) මූලධන තක්සේරු – විවිධ දේපල සඳහා වන වර්ගීකරණ ක්‍රියා පිළිවෙත, අනිවාර්ය අත්කර ගැනීම්, ඇස්තමේන්තු විකුණුම් /මිළදී ගැනීම් සහ බදු කටයුතු සඳහා තක්සේරු ක්‍රම.

*කාලය :* සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා පැය 1 සිට 2 දක්වා කාලයකි.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40%.

*II කොටස :*

දෙන ලද දේපලක් සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයක් සඳහා සවිස්තාරාත්මක තක්සේරු වාර්තාවක් පිළියෙල කිරීම.

වාර්තාව පිළියෙල කිරීමේදී දෙනු ලබන උපදෙස් පරිදි අපේක්ෂකයා විසින් දේපල පරීකෂා කර දී ඇති දත්ත විශ්ලේෂණය කර අවශ්‍ය අමතර දත්ත උපකල්පනය කර දේපලේ තක්සේරු වටිනාකම යෝජනා කිරීම අපේක්ෂා කරනු ලැබේ. මෙහිදී තක්සේරු වටිනාකමෙහි නිරවද්‍යතාවය වැදගත් සේ සළකනු නොලැබුවද අදාළ නෛතික රාමු තුළ විශ්ලේෂණය සහ විධිමත් ක්‍රියාවලියක් උපයෝගී කර ගැනීම වැදගත් සේ සලකනු ලැබේ.

කාලය : අවමය පැය 3ක් සහ උපරිමය පැය 6 ක් අතර කාලයකි.

සමත්වීමට ලබාගත අයුතු අවම ලකුණු ප්‍රමාණය : විභාගයේ කොටස් දෙකෙන් එක් එක් කොටස සඳහා 40%කි

(ඇ) (i) ii පංතිය ii ශ්‍රේණිය සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (වැටුප් පියවර රු. 24,225/- ට පෙර)
මෙම පරීක්ෂණය පහත සඳහන් පරිදි i සහ ii කොටස් වලින් සමන්විත වේ.

*I කොටස :*

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පංතිය II ශ්‍රේණියේ නිළධාරීන් සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ පහත සඳහන් විෂයයන් ශ්‍රී ලංකා තක්සේරු සේවයේ II පංතියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ විය යුතුය.

(I) මූල්‍ය ක්‍රම

(II) පරිපාලනය

සටහන : අපේක්ෂකයා විසින් වරකට එක් විෂයය බැගින් හෝ එක් වරම විෂයයන් දෙකම සඳහා හෝ විභාගයට පෙනී සිටිය හැකිය.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය .– ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ට අදාල සමත් කිරීමේ ලකුණු ප්‍රමාණයම මෙයටද අදාල වේ.

*II කොටස* :

මෙම කොටස පහත සඳහන් එක් එක් විෂයයන් සඳහා වන ලිඛිත ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

(i) ව්‍යවහාරික තක්සේරුකරණය,

(ii) තක්සේරු ඒකක කළමණාකරනය

*විෂය නිර්දේශය :*

(i) ව්‍යවහාරික තක්සේරුකරණය,

( අ) භාවිතයේ ඇති තක්සේරු මූලධර්ම ;
(ආ) ව්‍යවස්ථාපිත තක්සේරු කිරීම් ; උදා : ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ තක්සේරු කිරීම් ආදිය;
(ඇ) කෘෂිකාර්මික තක්සේරු කිරීම් ;
(ඈ) වත්කම් හා කීර්ති නාම තක්සේරු කිරීම.

ii තක්සේරු ඒකක කළමනාකරණය

තක්සේරු ඒකක කළමනාකරණයේලා ගැනෙන දෙපාර්තමේන්තු නියෝග හා චක්‍රලේඛ උපයෝගී කර ගැනීම, කළමනාකරණ සහකාර හා සහායක නිලධාරීන්ගේ රාජකාරී, ඒකකයේ ප්‍රගති පාලනය, පලාත් තක්සේරුකරු සමඟ පැවතිය යුතු සම්බන්ධතාවය, මූල්‍ය පරිපාලනය දී කර ඇති බලය පැවරීම, තක්සේරු ඒකකයේ ආයතනික කටයුතු, ඒකකයේ ආරක්ෂාව හා විනය, විනය කාර්ය පරිපාටිය.

කාලය : එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා පැය 3 බැගිනි.

*සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය* : එක් ප්‍රශ්න පත්‍රයකට 50% බැගින්.

(ඇ) (ii) ii පංතිය ii ශ්‍රේණිය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය – (වැටුප් පියවර රු. 26,805/- ට පෙර)

දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය උසස් තක්සේරුකරණය පිළිබඳ පැය 03 ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය.

## විෂය නිර්දේශය

*උසස් තක්සේරුකරණය* :

ගුවන් තොටුපලවල්, ගොල්ෆ් පිටි, මත්පැන් විකිණීමට බලපත්‍ර ලැබූ ස්ථාන, විනෝදාගාර සහ ක්‍රීඩාගාර, සාප්පු සංකීර්ණ, ලැගුම් පහසුකම් සහිත හෝටල, මහජන උපයෝගීතා දේපල යනාදි විශේෂකාර්ය දේපල සම්බන්ධයෙන් මූලධන සහ වරිපනම් කටයුතු සඳහා තක්සේරු කිරීම් සහ ඛණිජ සම්පත් සහිත ඉඩම් තක්සේරු කිරීම සඳහා බලපාන මූලධර්ම.

තක්සේරුකරණය සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සමාගම්වල ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීම.

තක්සේරු ක්‍රම සඳහා විවිධ ඉඩම් ආර්ථික විද්‍යා මූලධර්ම සහ සිද්ධාන්ත යොදා ගැනීම, අඩු තොරතුරු සහිත වෙළඳපල තුළ තක්සේරු කිරීම්.

මෙම ප්‍රශ්න පත්‍රයට රචනා ශෛලියේ ප්‍රශ්න මෙන්ම තක්සේරුකරණයට අදාළ ගැටළු ද ඇතුළත් වේ.

කාලය : පැය 03 කි.

සමත් කිරීමේ අවම ලකුණු ප්‍රමාණය 50% කි.

### 03 වන උපලේඛනය

*සේවා විභාග*

(අ) III පංතිය I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට III පංතිය II ශ්‍රේණිය සඳහා වන I වන සේවා විභාගය.

මෙම විභාගය පහත දැක්වෙන එක් එක් විෂයයක් යටතේ වන ලිඛිත ප්‍රශ්ණ පත්‍රවලින් සමන්විත වේ.

(i) ව්‍යවහාරික තක්සේරුකරණය,

(ii) ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ අභියාචනා සඳහා අදාළ ලේඛන පිළියෙල කිරීම සහ වරිපනම් විරෝධතා පරීක්ෂණ සඳහා ලේඛන පිළියෙල කිරීම.

*විෂය නිර්දේශය* :

(i) ව්‍යවහාරික තක්සේරුකරණය,

විශේෂිත කාර්යය දේපල, එනම්, කර්මාන්තශාලා, ගබඩා සහ ගුදම්, ලැගුම් පහසුකම් සහිත හෝටල ආදිය සම්බන්ධයෙන් තක්සේරු කිරීම.

එක් එක් අවස්ථාවන්හීදි විවිධ තක්සේරු ක්‍රම භාවිතා කිරීම පිළිබඳව අපේක්ෂකයාගේ නිපුනත්වය මෙහිදී පරීක්ෂා කරනු ලැබේ.

(ii) වරිපනම් බදු තක්සේරු විරෝධතා සහ ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන අභියාචනාවන්ට අදාළ මූලික කරුණු සහ අදාළ ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන් සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

කාලය : එක් ප්‍රශ්ණ පත්‍රයකට පැය 03 බැගිනි.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය : එක් ප්‍රශ්ණ පත්‍රයකට 40% බැගිනි.

(ආ) II පංතිය I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට II පංතිය II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන දෙවන සේවා විභාගය.

(i) නිබන්ධනය

හෝ

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක දේපළ කළමනාකරණය හා/හෝ තක්සේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධියක්

***නිබන්ධනය*** :

ප්‍රධාන තක්සේරුකරුගේ පූර්ව අනුමැතිය සහිතව අනිවාර්ය අත්කර ගැනීම් හෝ වරිපනම් බදු තක්සේරුකරණය පිළිබඳව අපේක්ෂකයා විසින් තෝරාගනු ලැබූ මාතෘකාවක් මත වචන 7500 ක් පමණ වන නිබන්ධනයක් නිශ්චිත කාලයක් තුළදී ඉදිරිපත් කිරීම. මෙම කාලය ඉහත සඳහන් පරිදි අනුමැතිය ලද දින සිට එක් වසරකට නොවැඩි කාලයක් වනු ඇත.

*සටහන* :

මෙම සේවයේ I හෝ II පංතියේ නිලධාරීන් තිදෙනෙකුට නොවැඩි ගණනකින් සමන්විත වන පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ ඉහත නිබන්ධනය අගැයීම සඳහා පෙනී සිටින ලෙස අපේක්ෂකයාගෙන් ඉල්ලා සිටිය හැකිය. ප්‍රධාන තක්සේරුකරු ඉහත පරීක්ෂණ මණ්ඩලයේ සභාපති විය යුතුය.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 50% කි.

### 04 වන උපලේඛනය

*තරඟකාරී ප්‍රවේශ විභාග*

(අ) ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පංතියේ IIශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟකාරී ප්‍රවේශ විභාගය.

මෙය ප්‍රශ්ණ පත්‍ර දෙකකින් සමන්විත වේ.

*I වන ප්‍රශ්ණ පත්‍රය :*

මෙම ප්‍රශ්ණ පත්‍රය, ප්‍රශ්ණ 25 කට නොවැඩි, දේපළ පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයයන්ට අදාළ බහුවරණ ප්‍රශ්ණ පත්‍රයක් වේ.

කාලය විනාඩි 30 කි.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 50% කි.

*II වන ප්‍රශ්ණ පත්‍රය :*

සාමාන්‍යයෙන් මෙම ප්‍රශ්ණ පත්‍රයට පදනම් වනුයේ දේපල පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයය ක්ෂේත්‍රයට අදාල වන මාතෘකාවන් ය.

කාලය විනාඩි 45 සිට පැය 1 දක්වා

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 50% කි.

(ආ) ශ්‍රී ලංකා තක්සේරු සේවයේ **II** පංතියේ **II** ශ්‍රේණියට බඳවාගනු ලබන්නන් සඳහා වන විවෘත තරඟ විභාගය.

මෙය ප්‍රශ්ණ පත්‍ර දෙකකින් සමන්විත වේ.

***I** වන ප්‍රශ්ණ පත්‍රය :*

මෙම ප්‍රශ්ණ පත්‍රය, ප්‍රශ්ණ 25 කට නොවැඩි, බහුවරණ ප්‍රශ්ණ පත්‍රයක් වේ. සාමාන්‍යයෙන් මෙම ප්‍රශ්ණ පත්‍රයට පදනම් වනුයේ දේපල පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයය ක්ෂේත්‍රයට අදාල වන මාතෘකාවන් ය.

කාලය විනාඩි 30 කි.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 50% කි.

***II** වන ප්‍රශ්ණ පත්‍රය :*

මෙය රචනා ශෛලියේ ප්‍රශ්ණ පත්‍රයකි.

දේපල තක්සේරුකරණය සහ ආශ්‍රිත ක්ෂේත්‍රයන්ට අදාල, විශේෂයෙන්ම ඉඩම් ආර්ථික විද්‍යාව, දේපල වෙළඳපල සහ ආයෝජන වෙළඳපල අනුසාරයෙන් සකස් කෙරෙන මාතෘකාවන් මත රචනා ලිවීම. ඉහත දැක්වූ විෂයය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ පුළුල් දැනීම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්ණ පත්‍රය සකස් කරනු ලැබේ.

කාලය පැය 2 කි.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 50% කි.

(ඇ) ශ්‍රී ලංකා තක්සේරු සේවයේ **II** පංතියේ **II** ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සීමිත තරඟ විභාගය.

මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

*I කොටස :*

මෙම ප්‍රශ්ණ පත්‍රය, ප්‍රශ්ණ 20 කට නොවැඩි බහුවරණ ප්‍රශ්ණ පත්‍රයක් වේ. සාමාන්‍යයෙන් මෙම ප්‍රශ්ණ පත්‍රයට පදනම් වනුයේ දේපල පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයය ක්ෂේත්‍රයට අදාල වන මාතෘකාවන් ය. (ලකුණු 40 කි)

කාලය : විනාඩි 30 කි.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය : 50% කි.

*II කොටස* :

දෙන ලද ප්‍රශ්ණ හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතු රචනා ශෛලියේ ප්‍රශ්ණ පත්‍රයකි. (ලකුණු 60 කි)

අපේක්ෂකයාගේ පළපුරුද්ද, තක්සේරු මූලධර්ම, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ රෙගුලාසි පිළිබඳ දැනුම මෙන්ම දේපල වෙළඳපල, නගර නිර්මාණය සහ ඉඩම් ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුමද පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න සකස් කරනු ලැබේ.

කාලය : පැය 2 කි.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය : 50% කි.

(ඈ) විශිෂ්ඨ ගණයේ කාර්යසාධන මට්ටමක් නොකඩවා පවත්වාගෙන ගිය III පංතිය II ශ්‍රේණිය නිලධාරින් ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පංතියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරහ විභාගය.

මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

*I කොටස* :

මෙම ප්‍රශ්ණ පත්‍රය, ප්‍රශ්ණ 20 කට නොවැඩි බහුවරණ ප්‍රශ්ණ පත්‍රයක් වේ. සාමාන්‍යයෙන් මෙම ප්‍රශ්ණ පත්‍රයට පදනම් වනුයේ දේපල පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයය ක්ෂේත්‍රයට අදාල වන මාතෘකාවන් ය. (ලකුණු 40 කි)

කාලය : විනාඩි 30 කි.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය : 50% කි.

*II කොටස* :

දෙන ලද ප්‍රශ්ණ හතරකින් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතු රචනා ශෛලියේ ප්‍රශ්ණ පත්‍රයකි. (ලකුණු 60 කි)

අපේක්ෂකයාගේ පළපුරුද්ද, තක්සේරු මූලධර්ම, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ රෙගුලාසි පිළිබඳ දැනුම මෙන්ම දේපල වෙළඳපල, නගර නිර්මාණය සහ ඉඩම් ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුමද පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න සකස් කරනු ලැබේ.

කාලය : පැය 2 කි.

සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය : 50% කි.

06-280

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.